31 වන පිටුවෙන් (අක්කරේ)

රත්වූ සිමෙන්ති පඩියේ උණුසුම වියැකී යන තුරුම කල්පනා සයුරක ගිළී සිටි කරුණාදාසට පියවි සිහිය ලැබුණේ කැහැ කැහැ පැමිණි තවත් යකා බසයක් නිසාය. මුණුපුරා කරුණාදාසයේ ඔඩොක්කුවේම ගුළි වී නිදා ගෙන සිටියේ සිංහල හෝඩි පොතද තුරුලු කරගෙනය. කරුණාදාස මුණුපුරාගේ හිස අසීමිත කරුණා බරිත හැඟීමකින් පිරිමැද්දේය. දෙනෙත් පියා ගෙන, මුව මදක් විවර කරගෙන හේ නිදයි. දරුවා හුස්ම ගන්නා හඬද කරුණාදාසට ඇසේ.

බිම කළුවර වැටුණු පසු අවේලාවේ එක්වරම මහගෙදරට කඩා වැදුණු මද්දුම් කරුණාදාසගේ සිතට ඇතුළු කළේ ප්‍රශ්නාර්ථයකි. එනපොට නොහොඳ බව ඔහුට ඉවෙන් මෙන් වැටහෙන්නට විය. තම පියාගේ මුහුණ පවා නොබලා සිමෙන්ති පඩි දෙක නැගගත් මද්දුම්ත්, බැනාත් කෙළින්ම ගියේ කරුණාදාසගේ බිරිඳගේ කාමරයටය. කරුණාදාගේ බිරිඳ මහගෙදර සිටින මද්දු පුතාගේත්, ලේලියගේත් හැර විටින් විට අවස්ථානුකූලව අන් සියලු දරුවන්ගේම පැත්ත ගනී. මද්දුම් දැන් තම මව සමග කාමරයට වී කුටු කුටු ගායි. කරුණාදාස බර කල්පනාවකය.

එක් වරම කරුණාදාස බලාපොරොත්තුව සිටි අවස්ථාව එළඹුණි. එහෙත් කරුණාදාස මේ අවස්ථාවට මුහුණ දීමට මුළින්ම සැළසුම් කර තිබුණි. ඒ කවර කතා බහක් ඇති වුවද මුවෙන් වදනකුදු නොදෙඩීමටය.

"මොකද්ද තාත්තා මේ කරන කැත වැඩ. තාත්තට ලැජ්ජාවක් ගැවිලාවත් නැද්ද? තාත්තා මගේ මිනිහට පොරොන්දු වුනා නේද අක්කරේ ඉඩම අපට දෙනවා කියලා. අද මම ආවේ අන්තිම වතාවට තාත්තගෙන් අහන්න අඩුගාණේ අක්කරේවත් අපට දෙනවද නැද්ද කියලා?" හදිසියේ නිවසට කඩා වැදී කෑ ගැසන හඬ ඇසී කුඩා මුණුපුරා අවදි වී දඩි බිඩි ගා ගෙතුළට දිව ගියේය.

මහළු කරුණාදාස කලින් සිටි පරිදිම අරමුණකින් තොරව පාර දිහා බලාගෙනය. ඇසූ කන් නෑසෙන ගානට අරමුණකින් තොරව ඔහු සිනාසීමට තැත් කරයි. කරුණාදාස මද්දුම්ට කිව යුතු දේ සිතයි.... එහෙත් නොකියයි. "අනේ දුවේ මගේ දෙමවුපියෝ මට කිසිදෙයක් දීලා නැහැ. මම ඉල්ලලත් නැහැ. නහින දෙහෙන කාලේ මට වද නොදී ඇයි බැරි උඹළටත්, මහන්සි වෙලා යමක් කමක් හොයාගන්න."

මද්දුම් තෝරතෝනෝංචියක් නැතිව කියවයි. මද්දුම්ගේ මව ඇයගේ පැත්තට හූ මිටි තබයි. එහෙත් ඇයට සැබවින්ම අවශ්‍ය වූයේ අක්කරේ මද්දුම්ට නොව බඩපිස්සීට ලියා දීමටය. එහෙත් දැන් ඇය කරන්නේ කරුණාදාස දඬු අඬුවට හිර කිරීමේ කර්තව්‍යය. ඇය එය ඉතා හොඳින් කරන්නීය. බෑනා කුෂන් පුටුවක වාඩි ගෙන සීලිමේ එල්ලෙන විදුලි බුබුළ දෙස බලා සිටියි. මද්දු පුතාගේ ලේලිය තම සැමියා නිවසේ නැති වීම ගැන දෙවියන්ට පිං දෙමින් මුළුතැන් ගෙයි වළං පිඟන් හා හැප්පෙයි. මුණුපුරා ඇගේ ගවුම කොණක එල්ලී ඇය යන යන තැනට යයි - එයි. මුණුපුරාගේ අනෙක් සොයුරියෝ කා බී දූනටමත් තද නින්දේය.

කරුණාදාස දෝෂාරෝපණ අතරින් තමාගේම ජීවිතය දෙස හැරී බලයි. එකල ඔහු තම අණසක පැතිරුවේ දරුවන් කෙරෙහි පමණකි. දැන් දරුවෝ තමා කෙරෙහි පමණක් ඔවුනගේ අණසක සිතැඟි පරිදි පතුරුවති. එකල දරුවෝ නිහඬය. මෙකල කරුණාදාස නිහඬය. කරුණාදාසට සියලු දේම ඇතැර කොහේ හෝ යාමට සිතේ. එහෙත් කොහේ යන්නද? එහෙත් තමා මිය යන තුරුම මුණුපුරාගේ මුහුණ නොබලා සිටීම කරුණාදාසට කිසිසේත්ම කළ හැකි දෙයක් නොවේ. කරුණාදාස තම ජීවිත කාලය පුරාවටම මෙබඳු දයාව මුසු ආදරයක් අන් කවර කෙනෙකුගෙන් හෝ ලැබුවා නම් ඒ ඔහු තරුණ කාලයේදී සිතින් නැරඹූ සිහින වල සිටි චරිත වලින් පමණකි. ඔහු බණ දහම ගැන එතරම් තැකීමක් නොකළේය. අදටත් එය එසේමය.

මද්දුම් දිගටම කියවයි. බැණා කරබාගෙන සිටී. කරුණාදාසගේ බිරිඳත් තම සැමියා නෝංජල් මිනිසෙකු යයි නොකියා කියයි. කරුණාදාස බටහිර අහසේ බහිරව කන්දට ඉහළින් දිළෙන ඉරබටු තරුව දෙස බලාගෙන සිටී. අවසානයේ මද්දුම් තම සැමියාවත් අතින් ඇදගෙන කරුණාදාස හිඳගෙන සිටින පඩි දෙකෙන් බසින අතර කරුණාදාසට මෙසේ කිය. "තාත්ත එකක් මතක තියා ගන්න මීට පස්සේ මම ආයේ තාත්තව බලන්නවත් එන්නේ නැහැ. මම හෙටම තාත්ත වෙනුවෙන් දානයක් දෙනවා. මීට පස්සේ අපි මේ ගෙයි පස් පාගන්නේ නැහැ" යි කියමින් තම සැමියාද කැටුව මළානික විදි ආලෝකය අතරින් නොපෙනී ගියාය. සිමෙන්ති පොළව සිසිල් වීමත් සමග තැනින් තැන ඇති කඩි ගුල් වලින් රතු කුඹි එළියට එති. එසේ ආ එකෙක් කරුණාදාසගේ තුනී සරම පාසාරු කරගෙන දකුණු කළවය විද්දේය. රතු කඩියාගේ තියුණු මුව කරුණාදාස එතරම් ගණත් නොගත්තේය. එහෙත් මද්දුම්ගේ තියුණු මුවින් විසි වූ වදන් කරුණාදාසගේ සිත නොසෑහෙන්න පෑරීය.

තාත්තා ඇවිත් කෑම කන්න.... ලේලිය පැමිණ කරුණාදාසට කථා කරන තුරුම ඔහු නැගී එන ඉරබටු තරුව දෙසැම අරමුණකින් තොරව දිගටම බලාගෙන සිටියේය. ඔහුට දඬි කුසගින්නක් දැණුනේය. එහෙත් කෑමට පිරියක් නොවීය. ඔහුගේ සිතේ ගින්නට කුස ගින්නද එක් වී තිබුණි. එහෙත් ඔහු එදින සිතේ ගින්නත්, කුසේ ගින්නත් සමග නිදි යහනට වැදී ඇති තරම් තම සිත තම සිතෙන්ම පෙළාගත්තේය. කිසිවෙකු පය නොතැබූ පාලු දිවයිනක තමා තනිව මංගල ඇඳුමකින් සැරසී තනිවම සිනාසෙමින් සිටින අයුරු කරුණාදාස සිහිනෙන් දුටුවේය.

පසුදා උදේ රැයින්ම අවදි වූ කරුණාදාස මුහුණ සෝදා, කොණ්ඩය බැඳ, තම කෝට් බැයද ඇඳගෙන අක්කරේට යන්නට පිටත් විය. බසයෙන් බැස අසල තේ කඩයට ගොස් තමා කෑමට බොහෝ කෑමති රෝස් පාන් දෙකකුත්, සීනි කෙසෙල් ගෙඩි දෙකකුත් මිළට ගෙන හිස් බාගේ අරක්කු බෝතලයකට කහට තේ වතුර එකක්ද වත්කර ගෙන අක්කරේට සෙමෙන් සෙමෙන් පියවර එසවීය. මෙතුවක් කල් තමාගේ දුකට සැපට සිටියේත්, තිබුණේත් අක්කරේය. මේ කරුණාදාස එහි පැමිණෙන අවසාන අවස්ථාව ලෙස තම සිතේ දඬිව සටහන් කරගත්තේය. මේ අක්කරය දෙකට බෙදා මද්දුම්ටත්, බඩපිස්සීටත් පවරා දීමට කරුණාදාස තීරණය කර හමාරය. මෙම තීරණය ලොක්කීගේත්, පොඩ්ඩීගෙත් මමණක් නොව අනෙක් දරුවන් අතරත් ගිනි ඇවිළ යාමට තුඩු දෙන බැව් කරුණාදාස හොඳින්ම දනී. එහෙත් කරුණාදාස තම සිත දඬි කර ගත්තේය. හැමදේම වෙන්නේ මිනිස්සුට. මගේ ළමයි මට දොස් කියයි. කමක් නැහැ. මම සද්ද නැතුව ඉන්නවා. ඔහු තම සිත හදා ගත්තේය.

ඔහුට අක්කරේ ගහක් ගලක් පවා ජීවමාන දරුවෙකුට,ගැහැණියකට හෝ සහෝදර සහෝදරියකට වඩා ලෙන්ගතුය. එත්තේ බටහිරට වන්නට ගලා යන දොළ පහරත්, නැගෙනහිරට වන්නට ගල් අන්නාසි වැවී තිබුණු කුඩා ගල් තළාවත් මේ වත්තේ ඔහු බොහෝ ප්‍රිය කළ ස්ථානයන්ය. කරුණාදාස මුලු වත්ත පුරාම සෙමෙන් සෙමෙන් ඇවිද්දේය. ඉඳ හිට තුරු මුදුන් දෙසද බැලුවේය. කරුණාදාසගේ සිතේ මේ ඉඩම කෙරෙහි ඇත්තේ තණ්හාවක් නොව අතිශය හෘද්‍යාංගම බැඳීමකි. ඔහු තම තරුණ කාලය පය ගෙවෙන තුරු ඇවිද්දේත්, කරගැට කැඩී යළි හැදී නැවත කැඩෙන තෙක් වැඩ කළේද තම දරුවන් අට දෙනාටම අඩුතරමින් අක්කරේ මෙන් ඉඩම් කැබලි අටක්වත් මිළට ගැනීමටය. එහෙත් ඒ සඳහා ඔහුගේ මහන්සිය ප්‍රමාණවත් නොවිණි. කාලය ගත විය. කරුණාදාස ඉක්මණින්ම මහළු වයසට ආවේය.

අක්කරේ පුරා සෙමෙන් සෙමෙන් ඇවිද යන අතර කරුණාදාසට තමාගේම දියණියක් තමා මිය යාමටත් පෙරාතුව තමා වෙනුවෙන් දානයක් දෙන බව කෙසේ පැවසුවාදැයි අදහා ගැනීමට පවා නොහැකිව සිහද වික්ෂිප්ත භාවයටට විය. ඔහුට විශාල දුකක් ඇති විය. කරුණාදාස සියලුම දරුවන්ට එක සේ දඬි දඬුවම් දී තිබිණ. දඬුවම් දීමේදී දියණියන්ද, පුතණුවන්ද යන්න ගැන ඔහු එතරම් තැකීමක් නොකළේය. වසර පණහකට පමණ පසු ඔහු තමා දරුවන්ට දඬුවම් කරන විට තමාගේ සිතේ කවර කොණක හෝ තුළ පළිගැනීමක්, වෛරයක්, ක්‍රෝධයක් තිබුණාදැයි විමසා බලන්නට විය. ඔහු ගසක් යට හිඳගෙන තවදුරටත් ඒ ගැන කල්පනා කළේය. ඔහුට අවශ්‍ය වූයේ තම දරුවන් කෙසේ හෝ සමාජයේ දිදුළන තාරකාවන් කිරීමටය. එහෙත් අවසානයේ දිට්ටේ තරු දෙකක් පමණකි. දිළෙන තරු දෙක සිහිවී කරුණාදාස දිගු හුස්මක් හෙළුවේය. ඔහු අහස දෙස බැලුවේය. සුපැහැදිළි නිල ආකාසයේ සිහින් වළාවක් දෙකක් අයාළේ ඇදී යනු ඔහු දුටුවේය. තමාගේ ජීවිතයත්, හිස් අහසේ අයාලේ යන සිනිඳු වළාවකුළත් අතර සමානකමක් ඔහුට ඉවකින් මෙන් දනුනේය. එහෙත් කරුණාදාස හැඟීම් වල දාසයකු මිස සොබා දහම තම ජීවිතයට ගලපා ගැනීමට තරම් දූන උගත් අයෙකු නොවීය.

කරුණාදාස අදින් පසු නැවත කිසි දිනක අක්කරේට නොඑන්නට තීරණය කර හමාරය. ඔහු අක්කරයේ ලබා ගන්නා අවසාන භෝජන සංග්‍රහය ලබා ගැනීමට ගල් අන්නාසි වැවී තිබුණ ගල් තළාව මතට ගොඩවීය. ගල්තලාවට පසෙකින් වූ උණ පඳුර එක්වරම වියළි සුළඟින් කිං කිණි හඬක් නංවා එක්වරම මීයකට පිම්බාක් මෙන් නිහඬ විය. කරුණාදාස හරි බරි ගැසී උණ පඳුර යටින් හිඳ ගැනීමට තැත් කරනවාත් සමගම තේ කහට දමා තිබුණු බාගේ අරක්කු බෝතලය පත් මල්ලෙන් රූටා වීත් ගල් තලාව මත වැටී බිඳී ගියේය. බිඳුනු වීදුරු කටු අනුළා උණ පඳුර යටටම විසි කළ කරුණාදාස එතැනම උක්කුවටියෙන් වාඩි වී පත් මල්ලෙන් රෝස් පාන් ගෙඩියක් එළියට ගත්තේය. වේල් දෙකක් කුස ගින්නේ සිටියද පෙරදා රාත්‍රියේ මෙන් ඔහුට දැන් කුස ගින්නක් නොදැනෙන්නේය. ඔහු හිල් බැනියමට යටින් තම කුස අතගා බැලුවේය. කුසේ රැළි වල සිනිඳු බව අත්ළෙන් විඳගෙන සීනි කෙසෙල් ගෙඩියද දකුණතින් ගෙන රෝස් පාන් ගෙඩිය අල්ලාගෙන සිටි වමතින්ම අඬක් ලෙලි ගැසුවේය.

කුරුණාදාසට තම මද්දු දියණිය සිහිවිය. ඔහුගේ දෙනෙත කඳළින් බොඳ විය. ඔහුට තමා මහන්සිවී සතය දෙක උපයා ගත් අයුරු සිහි විය. ඒ උපයා ගත් සතය දෙක වියදම් කර දරුවන්ගේ කර දඬු උස් මහත් කළේය. ඔහුට තම දෙමව්පියන්ගෙන් හෝ බිරිඳගෙන් ලැබුණු දෙයක් නොවීය. කිසිවෙකුගේ හෝ උදව් උපකාරයක් නැතිව කුස දහයක් කෙසේ හෝ පිරවූ බව ඔහුට සිහිවිය. කුස දහයටම වට එක් බත් හුළකුදු හොරයක්, වංචාවක් ගැවී නැති බව පසක් වී කඳුළු අතරින් ඔහුට ඉතා සංවේදී තෘප්තියක් ඇතිවිය. පින් දහම් කිරීමට එතරම් වෙහෙසක් දරුවේ නැති මුත් කාගෙන් හෝ කිසිවක් කඩා වඩා නො-ගැනීමත්, මතක් කර ගැනීමට තරම් හොර බොරුවක් නොකර තිබීමත් ගැන අහිංසක ආඩම්බරයක් ඔහු කෙරේ ඇතිවිය.

මද්දුම්ගේ තරම කරුණාදාස දනී. ඇය සමහර විට ඇත්තටම තමා වෙනුවෙන් දානයක් දෙනවා විය හැකිය. එසේ දෙනවා නම් එයින් ලැබෙන පින මද්දුම්ටත්, තමාටත් යහපතක්ම උදාකරදේවා යැයි කරුණාදාස කෙළ වියළී ගිය දිවෙන් සහ දෙතොළින් එක විට දෙවරක් උගුර තෙත් කරන ගමන් පැතුවේය.

කරුණාදාස තමාගේ මුවේ ඉතිරිව ඇති දත් කිහිපයෙන් වියළි රෝස් පාන් ගෙඩියේ කැබැල්ලක් ඕනෑවට එපාවට මෙන් හපා කඩා ගත්තේය. එහෙත් එකල්හි ඔහුගේ සිත තිබුණේ තමා බුදින ආහාරයේ නොව අන් තැන් තැන් වලය. ඒ නිසාවෙන්ම කටට ගත් ආහාරය නොවිකාම ගිල්ලේය. කරුණාදාසගේ ඇස් උඩ ගියේය. දෑතින්ම ගෙළ බදාගෙන හිට ගැනීමට වෙර දරුවේය. එහෙත් ඔහුට අහසත්, තුරු මුදුනුත් කැරකී කැරකී යනවාක් මෙන් පෙනී නොපෙනී යළිත් පෙනුනේය. ඔද වේලාවකින් ඔහු රත් වූ ගල් තළාව මත මුනින් තලාවී ඇද වැටිණ. කරුණාදාසට තම නිවසේ සැඳෑ කාලයට හිරු එළියෙන් රත් වන සිමෙන්ති පඩි දෙක මතක් විය. ඔහුට තම දෑස ඉදිරියේ විසිරී ගිය තේ කහට තොළ ගාන රතු කඩියෙක් අලියෙක් තරම් මහ විශාලෙට පෙනුනේය. මුණුපුරාගේ පස්සා පැත්ත කඩියෙක් දෂ්ය කිරීම නිසා ඔහු එක තැන උඩ පැන පැන දිව ගිය අයුරුද සිහි විය. එසැනින්ම කරුණාදාසගේ වත හරහා සුන්දර සිනා රැල්ලක් අවිහිංසක ලෙස හමා ගියේය.